# වත්තල ප්‍රාදේශීය සභාව

## ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජූලි 16 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 මාර්තු 05 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති වත්තල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියෝ රු.1,394,000 ක් හා ගබඩා ණය හිමියෝ රු.2,149,024 ක් ලෙස එකතුව රු.3,543,024 ක් වැඩිපුර වෙන්කර තිබිණි.

(ආ) හැඳල උත්සව ශාලාවේ බදුකුලී වෙනුවෙන් 2009. මැයි 20 දින ලබාදුන් අංක 574122 දරන රු.974,800 ක් වටිනා චෙක්පත අගරුවී තිබුණ ද, අගරු වු චෙක්පත් ගිණුමට හර කර වසර 03 ක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඇ) 2012 වර්ෂය තුළ මිලදී ගන්නා ලද රු.10,483,536 ක හා නිකුත් කරන ලද රු.9,959,483 ක වටිනාකම වු භාණ්ඩ ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව තොග ලේඛනවල ඇතුළත් කල යුතු වුවත්, 2012 වර්ෂය තුළ සිදුකළ මිලදී ගැනීම් හා නිකුත් කිරීම් සඳහා තොග ලේඛන නඩත්තු කර නොතිබණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.104,089,045 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.49,175,931 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.96,685,580 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

(අ) ගෙවීමට ඉදිරිපත් නොවු චෙක්පත් 119 ක වටිනාකම රු.1,235,301 ක් 2010 වර්ෂයේදී මිශ්‍ර තැන්පත් ගිණුමට ගෙන තිබු අතර, මින් චෙක්පත් 98 ක්ම රාජ්‍ය ආයතන වෙත ගෙවීමට තිබු චෙක්පත් විය.

(ආ) 2008 වර්ෂයේ සිට පැවත එන රු.449,024 ක් වටිනා කල් ඉකුත්වු චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ සැපයුම් සඳහා ගෙවා තිබු එකතුකළ අගය මත බදු මුදල් වටිනාකම රු.430,192 ක් නිමැවුම් බද්දෙන් හිලව් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

2.3.2 **වරිපනම් බදු**

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.76,007,474 ක් වු අතර, එයින් රු.5,000 ට වැඩි හිඟ වරිපනම් ඒකක 1658 ක එකතුව රු.21,894,517 ක් ද රු.50,000 ට වැඩි හිඟ වරිපනම් ඒකක 38 ක එකතුව රු.7,090,056 ක්ද, විය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියේ විධිවිධාන අනුව හිඟ බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි.

2.3.3 **වෙනත් ආදායම්**

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වෙනත් ආදායම් රු.20,610,578 ක් වු අතර, වසර 1 ත් 3 ත් අතර හිඟ ශේෂයන්ගේ එකතුව රු.2,500,579 ක්ද, වසර 3ත් 5ත් අතර හිඟ ශේෂයන්ගේ එකතුව රු.2,128,221 ක්ද, වසර 5 ඉක්මවු හිඟ ශේෂයන්ගේ එකතුව රු.1,498,913 ක්ද, විය.

**2.4** **ඩෙංගු ව්‍යාපෘතිය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය දක්වා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව අනියම් හා කොන්ත්‍රාත් පදනම මත ඩෙංගු ව්‍යාපෘතිය සඳහා සේවකයින් 117 ක් බඳවාගෙන තිබු අතර, එම

සේවකයින් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.22,281,065 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) එම සේවකයින් සඳහා නිශ්චිත රාජකාරි පැවරීම් ලබාදී නොතිබුණි. හැඳල උප කාර්යාලයට අනුයුක්ත ඩෙංගු මර්දන සේවකයින්ගේ 2013 ජනවාරි මස පැමිණීමේ ලේඛනය, වෙක්රෝල සමඟ රාජකාරි අනුයුක්ත කිරීම් පරීක්ෂා කිරීමේදී මෙම සේවකයින් සෞඛ්‍ය කම්කරු, මාර්ග කම්කරු හා කාර්යාල වැඩ සඳහා යොදවා තිබූ අතර, ඩෙංගු මර්දන ව්‍යාපෘතියන් සඳහා යොදවා තිබූ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) අනියම් හා ව්‍යාපෘති සේවකයින් 117 දෙනෙකු 2003 වසරේ සිට 2012 වර්ෂය දක්වා කාලය තුළ බඳවා ගෙන තිබුණද, 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10(1) හා 10(2) වගන්ති අනුව සභාවේ සේවය සඳහා යොදවා ගත් සියළුම අනියම්, ආදේශක සේවකයින් සඳහා සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවා නොතිබුණි.

2.5 <u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u>

2012 වර්ෂයේ ණයහිමියන් යටතේ වෙන්කරන ලද වටිනාකම රු.3,281,000 ක සභා අරමුදල් ව්‍යාපෘති 05 ක් විගණිත දිනය වූ 2013 ඔක්තෝබර් 28 දින වන විටත් නිම කර නොතිබුණි.

2.6 <u>වත්කම් කළමනාකරණය</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත්ව තිබූ රු.5,325,364 ක් වටිනාකම් වූ අක්කර 20 පර්චස් 38 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 29 ක් සඳහා මැනුම් කටයුතු කර ඔප්පු සකස් කර ගැනීමට විගණිත දිනය වූ 2013 ඔක්තෝබර් 28 දිනය විටත් කටයුතු කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට මෙම ඉඩම්වල කරන ලද ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම්වල වටිනාකම රු.116,280,493 ක් විය.

(ආ) සභාවට හිමි දේපළ (ඉඩම් හා ගොඩනැගිලි) නිසි පරිදි සීමා මායිම් යොදා ආරක්ෂා නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉඩම් හා ගොඩනැගිලි යටතේ රු.1,892,161 ක් වටිනාකම ඇති ඉඩම් කොටස් 9 ක් 2013 සැප්තැම්බර් 13 දින සිදුකරන ලද සමීක්ෂණයේදී හඳුනාගත නොහැකි වූ බවට වාර්තා කර තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබූ රු.6,086,839 ක් වටිනාකම් වූ ඉඩම් කොටස් 7 ක්ද, වටිනාකම් දක්වා නොතිබුණු ඉඩම් කොටස් 4 ක්ද, ගිණුමෙන් අත්හැරී තිබූ අතර, එම ඉඩම් කොටස් මේ වන විට භෞතිකව හඳුනාගත නොහැකි තත්ත්වයක් පවතින බව අනාවරණය විය.

(ඈ) අවසන් ගිණුම් අනුව වටිනාකම රු.2,158,357 ක්වූ ගිනි නිවන රථය 2003 නොවැම්බර් 05 දින වැලිසර නාවික හමුදාව වෙත රැගෙන ගොස් තිබුණද, රථය ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.7 ඝන අපද්‍රව්‍ය කළමණාකරණය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 ජනවාරි 07 දින සිට 2013 ජනවාරි 06 දක්වා වසර 01 කට වලංගු වන පරිදි බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමඟ අවබෝධතා ගිවිසුමක් ඇතිකරගෙන තිබූ අතර, ගිවිසුම අනුව කාල සීමාව අවසාන වීමට පෙර දෙපාර්තමේන්තුව විසින් විධිමත් ගිවිසුමකට එළඹියයුතු වුවත්, 2013 ඔක්තෝබර් 28 දක්වාම විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) අවබෝධතා ගිවිසුම අනුව 2012 ජනවාරි 07 දින සිට පාලන බල ප්‍රදේශයේ එකතු කරන වෙන් කරන ලද දිරන අපද්‍රව්‍ය හා ප්‍රතිචක්‍රීකරණය කළ හැකි නොදිරන අපද්‍රව්‍ය අංගනය වෙත ප්‍රවාහනය කළ යුතුය. 2012 අගෝස්තු මාසයේ සිට සභා බල ප්‍රදේශයේ වැලිසර, පමුණුගම ප්‍රදේශවලින් හා හැදල බල ප්‍රදේශයේ කොටසකින් පමණක්ද, වැලිසර ආර්ථික මධ්‍යස්ථානයේ දිරන කසළ පමණක්ද ජීව වායු ඒකකයට ලබා දී තිබුණි.

(ඇ) ජීව වායු ඒකකයට ලබා නොදී හැදල බල ප්‍රදේශයේ නොදිරන කසළ හා සභාවට අයත් අනෙක් ප්‍රදේශවල දිරන හා නොදිරන කසළ සභාවේ ඉඩමකට දමා පස් දැමීම සිදුකර තිබූ අතර, මේ නිසා දීර්ඝ කාලීනව භූගත ජල පද්ධතිය, ජල මාර්ග දූෂණය වීම වැනි පාරිසරික බලපෑම් ඇතිවීමට බොහෝ ඉඩකඩ සැලසෙන බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ඈ) කසළ තුනී කිරීමටත් පස් සඳහාත් සමාලෝචිත වර්ෂයේ වැය කර තිබූ මුදල රු.2,967,790 ක් විය.

## 2.8 හඳුනාගත් පාඩු හා හානි

සභාව වෙත කරන ලද පැමිණිලි සම්බන්ධව සභාව විසින් ක්‍රියාත්මක නොවීම නිසා සභාවට එරෙහිව පවරා ඇති නඩු 03 ක් වෙනුවෙන් 2012 හා 2013 වර්ෂවලදී රු.348,359 ක නඩු ගාස්තු ගෙවීමට සිදුවී තිබුණි.

## 3. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය.
(ඈ) තොග පාලනය.
(ඉ) මානව සම්පත් කළමනාකරණය